*සැ. යු.* - 2026.06.12 වැනි දින පළ කරන ලද අංක 2493 *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,494 - 2026 ජුනි මස 19 සිකුරාදා - 2026.06.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 158 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


*සැ. යු.* - ආර්ථික සහ ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2026 ජුනි මස 12 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 10 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජුනි මස 26 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

157 - B 082802 — (2026/06)
C 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

කොළඹ දී පවත්වනු ලබන සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුල මහරගම පමුණුව පිහිටි "දෙල්ගහවත්ත" නැමති ඉඩමට වර්ෂ 2001 අගෝස්තු 12 දින එම්. ඒ. ජයරත්න බලයලත් මානක තැන විසින් මැන සාදන ලද අංක. 3273 දරණ පිඹුරේ කැබලි අංක A1 නැමති ඉඩමේ නිවසක් සහිත ඉඩම් කොටස

| | | |
|---|---|---|
| නඩු අංක | : | CHC/346/2010/MR |
| ස්වභාවය | : | උකස්කර |
| කාර්යය පටිපාටිය | : | සාමාන්‍ය |
| වටිනාකම | : | රු. 7,200,000/- |
| ඇස්කිසි අංකය | : | 61/2025 |

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
බෑන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක. 28, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

*පෙර :*

එම් සී එස් එල් ෆිනෑන්සියල් සර්විසස් ලිමිටඩ්

*සහ*

මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්.

*...........පැමිණිලිකරු.*

*- එදිරිව -*

හිඹුටුගොඩ හේවගේ සිසිර කුමාර සමරසේකර,
අංක : 3A , ජයන්ති පටුමග,
පමුණුව, මහරගම.

*.............විත්තිකරු.*

කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපළ විකිණීමේ අධිකාරි පත්‍රයට අනුව නඩුවේ ඇතුලත් කර ඇති වර්ෂ 2013 ක් වූ නොවැම්බර් මස 26 දිනැති තීන්දු ප්‍රකාශය අනුව ඉහත විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු පැමිණිල්ලේ සඳහන් නඩු නිමිත්ත මත කෙටි කාලීන ණය අංක KBCRTL 0900223000 යටතේ 2010/03/11 දිනට රු. 7,199,134/35 ක මුදලක් සහ 2010/03/12 දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් කරනු ලබන තෙක් මසකට 4% බැගින් පොලියද සමග නඩු ගාස්තු ද අයකර ගැනීම සඳහා ආඥා කරමින් නියෝග කර ඇති හෙයින්ද,

මෙහි පහත උපලේඛනයේ විස්තරවන මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුල මහරගම පමුණුව පිහිටි "දෙල්ගහවත්ත" නැමති ඉඩමට වර්ෂ 2001 අගෝස්තු 12 දින එම් ඒ ජයරත්න බලයලත් මානක තැන විසින් මැන සාදන ලද අංක 3273 දරන පිඹුරේ කැබලි අංක A1 යන මායිම තුළ පිහිටි පර්චස් දහයක් (පර්:10) හෙවත් හෙක්ටයාර් 0.0253 ක විශාලත්වයෙන් යුතු ඉඩම වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කර ඇති බැවින් එම දේපල"

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 17 දින පෙ.ව.11.00 ට,**

දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය :*

මහරගම, පමුණුව පාරේ සිරි මංගලාරාම විහාරස්ථානයට කලින් ඇති ජයන්ති පටුමගේ මීටර් 200 ක් පමණ පැමිණි විට වම් පැත්තට එම පටුමගට මුහුණ ලා දේපල පිහිටා තිබේ.

*වෙන්දේසියේ ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් / නියෝජ්‍ය පිස්කල් වන මා වෙත පහත දැක්වෙන පරිදි මුදල් ගෙවිය යුතුය. සියලුම ගෙවීම් මුදලින් හෝ අණකරවලින් පමණක් ගෙවිය යුතුය. චෙක්පත් බාරගනු නොලැබේ.

(1) සම්පූර්ණ විකුණුම් මුදලින් සියයට විසිපහක් (25%) මුදලක් එවලේම මා වෙත ගෙවිය යුතුය. විකුණුම් මුදලේ ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේවන පිස්කල් ගාස්තු හා රජයේ ගාස්තු ද එම අවස්ථාවේදීම මා වෙත ගෙවිය යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මහරගම පමුණුව පිහිටි "දෙල්ගහවත්ත" නැමති ඉඩමට වර්ෂ 2001 අගෝස්තු 12 දින එම්. ඒ. ජයරත්න බලයලත් මානක තැන විසින් මැන සාදන ලද අංක 3273 දරන පිඹුරේ කැබලි අංක A 1 ට මායිම් උතුරට : ජයන්ති පටුමග ද, නැගෙනහිරට : අඩි 10 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද කොටස ද, දකුණට : අංක 3273 දරන පිඹුරේ කැබලි අංක A 2 ද සහ බටහිරට : ඩබ්ලිව්. පී. අල්විස්ට අයත් කුඹුර යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක් (පර්. 10) හෙවත් හෙක්ටයාර් 0.0253 ක විශාලත්වයෙන් යුතු ඉඩම සහ එය තුල පිහිටි ගසකොළ, පළතුරු ගොඩනැගිලි ආදි සියලු දේද සමග වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2555/88 හෝ M 3223/29 දරන පත්‍රිරුවල ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
කොළඹ වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2026 ක් වූ ජුනි මස 03 දින,
කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය.

06 - 231

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.